# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2159/46 - 2020 ජනවාරි මස 24 වැනි සිකුරාදා - 2020.01.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ප්‍රා.ලේ. යොමු අංකය.: ELDS/LND/08/ACQ/2017/04.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය.:
4-3/15/2017/VE/584.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තරය:*

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නවදුන් කෝරළේ, පල්ලේ පත්තුවේ, සමන්ගම ග්‍රාම නිලධාරී වසමේ (188 බී) මිල්ලවිටිය නැමැති ගමේ, සැලැස්මේ අංකය :- අ.ග.පි. 63, අතිරේක අංක : 12

01. කැබලි අංක 175; ඉඩමේ නම: මිල්ලවිටිය වත්ත; හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය: බලංගොඩ වැවිලි සමාගම, තැ.පෙ. 06, ෆාම්ගාඩ්න්, රත්නපුර; ප්‍රමාණය: හෙක්ටයාර් 2.2995.

*මායිම්:*

උතුරට: කැබලි අංක 20, 21 සහ මාර්ගය; නැගෙනහිරට: කැබලි අංක 21 සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ කැබලි අංක 20; බටහිරට: කැබලි අංක 20 සහ 21.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2020 මාර්තු මස 18 වැනි දින පෙ.ව. 10.30ට ඇලපාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2020 මාර්තු 11 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය. අයිතිවාසිකම් සනාථ කිරීම සඳහා ලිපිලේඛන එදිනට මාවෙත ඉදිරිපත් කළ යුතුයි.

එස්. ඒ. දිල්රුක්,
ප්‍රාදේශීය ලේකම්,
ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

ඇලපාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02-158

1A - G 31877 -17 (2020/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*